# ශ්‍රී ලංකා ජල සංසදය
# ජල සම්පත - අපේ ස්ථාවරය

ශ්‍රී ලංකා ජල සංසදය ඒකා බද්ධ ජල මූලාශ්‍ර කලමණාකරණ ක්‍රියාවලිය දිරිගැන්වීමට කැප වූ ද පරිසර හිතකාමී තුලනාත්මක සමාජ හා ආර්ථික සංවර්ධනයක් සඳහා රටේ ජල සම්පත චිරස්ථායිව භාවිතා කරන හා අගය කරන සමාජයක් අරමුණු කොට ක්‍රියා කරයි.

ඒ අනුව, "භූ තලය සියලූ මනුෂ්‍යයන්ට හා සත්වයන්ට අයිති වන අතර රජය එහි භාරකාරීත්වය දරයි." (මහා වංශය ක්‍රි.පූ.223) යන කියමන අනුව මනුෂ්‍යත්වය හා පරිසරය යන දෙකම අගය කරයි. සියලූ ජිවීන්ගේ ප්‍රයෝජනය සඳහා රජය ජල සම්පත ආරක්‍ෂිතව භාවිතා කළ යුතු වස්තුවක් ලෙස සළකයි.

ඒ අනුව, ශ්‍රී ලංකා ජල සංසදය ජල සම්පත රටටත් ජනතාවටත් අයිති ස්වභාවික වස්තුවක් ලෙස සලකන අතර ඇතැම් රටවල මෙන් එහි කළමණාකරණයට බහු ජාතික සමාගම් වල මැදිහත් වීම තරයේ විරුද්ධ වන අතර එවැනි මැදිහත්වීම් වලින් මහජනතාවගේ ජල අයිතිය බිඳ වැටෙන බව පිළිගනී.

ජල සම්පතේ භාරකරු වශයෙන් මහජනතාවට කාර්යක්ෂම සෙවයක් සලසනු වස් ජලය එහි කළමණාකරණයට පළාත් පාලන ආයතන, මහජන සංවිධාන, පුද්ගලික අංශයන්ට අවස්ථානෝචිත පරිදි සුදුසු බලයන්ට විමධ්‍යගත කිරීම හා පවරා දීමට ශ්‍රී ලංකා ජල සංසදය සහයෝගය පල කරයි.

පානීය හා ජීවනෝපාය සළසන ජලයට මුල් තැන දෙමින් මූලික මනුෂ්‍ය අවශ්‍යතාවයන්ට අවශ්‍ය ජලය ලබා ගැනීමේ හිමිකම තහවුරු කර ගනිමින් ජලය මූලික මානුෂික අයිතිවාසිකමක් ලෙස පිළිගනී.

පාරම්පරික ජලකළමණාකරණ විධි නව තාක්‍ෂණය යොදා ගනිමින් පවතවා ගත යුතු යැයි අනුදනී.

පානීය ජලය එය සපයන මූලාශ්‍ර ආරක්‍ෂා කර ගනිමින් වාරි කෘෂිකර්මාන්තය හා වී වගාව සඳහා ජලය ලබා දීම ජාතියේ ආහාර ආරක්‍ෂිතභාවයට අවශ්‍ය බව අවධාරණය කරයි.

දුර්වල සාමාජීය හා පාරිසරික හැසිරීම් රටාව නිසා මහජන සුභ සිද්ධියට, පරිසරයට, සෞඛ්‍යයට හා ජීවනෝපායන්ට තර්ජනයක් වන ජලයේ ගුණාත්මකභාවය අඩු වීම ගැන කණගාටු වන අතර එය නැති කර ගැනීම සඳහා සියලූ පාර්ශවකරුවන්ගේ සහාය අපේක්‍ෂා කෙරේ.

පරම්පරාවන් අතර සමානාත්මතාවය ගරු කරන අතර එය ඉලක්කය කරා යෑමට යහපත් ජල පාලනයක් අපේක්‍ෂ කෙරේ.

ඒකාබද්ධ ජල සම්පත් කළමණාකරණයක් සඳහා ආයතනික ව්‍යුහයක් ඇති කිරීමේදී සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් තිරණ ගන්නා විනිවිදභාවය, සමානාත්මතාවය හා කාන්තා අයිතිය සුරුකෙන ලෙස එය ඉටුකිරීමට සහාය වේ.